සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

23 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................. දේශපාලන විද්‍යාව I කාලය පැය දෙකයි

- **1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට (1,2,3,4,5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන ලකුණු කරන්න.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

❖ **අංක 1-16 තෙක් ප්‍රශ්න සඳහා ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දක්වා ඇත. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

01. දේශපාලනය
    1. බලය හා එහි භාවිතය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි.
    2. බලය සඳහා බල අරගලයක යෙදෙයි.
    3. මහත්වරුන් රඟ දක්වන ක්‍රීඩාවක් ලෙස ද සළකයි.
    4. උණ්ඩයෙන් හෝ ඡන්දයෙන් ක්‍රියාවට නැංවෙන බල අරගලය ලෙසද ප්‍රකාශ කරයි.
    5. අධිකාරී බලය භාවිතා කරමින් අගය කිරීම් බෙදා දැක්වීම පිළිබඳ ක්‍රීඩාවක් ද වෙයි.

02. දේශපාලන විද්‍යාව,
    1. රාජ්‍යයේ බලය පිළිබඳව හා ආණ්ඩුව පිළිබඳව හදාරන විද්‍යාව වෙයි.
    2. දේශපාලන සමාජය මුහුණ දෙන පුද්ගල ගැටලු පිළිබඳ අධ්‍යයනය කරයි.
    3. මිනිස් ජීවිතයේ ආරම්භය පැවැත්ම හා අවසානය අධ්‍යයනය කරයි.
    4. සමාජීය විද්‍යාවක් ලෙස පොදුවේ පිලිගනී.
    5. මිනිසුන් දේශපාලනය සමඟ සම්බන්ධ වීම කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කරයි.

03. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ,
    1. දේශපාලන භූමිකා ඵලදායීව හා සාර්ථකව ඉටු කිරීම සඳහා ය.
    2. අන්තර්ජාතික දේශපාලනය පිළිබඳව අධ්‍යයනය කිරීමට හැකිවන නිසාය.
    3. තමන් අකමැති පුද්ගලයන්ට මඩ ගැසීම හා ඔවුන්ව විවේචනය කිරීම සඳහාය.
    4. යහපත් රාජ්‍ය පාලකයෙකුවීම සඳහාය.
    5. තම යුතුකම් හා වගකීම් උපරිම අයුරින් ඉටුකිරීම සඳහා ය.

04. දේශපාලන විද්‍යාව විද්‍යාවකට වඩා කලාවක් ලෙස හඳුන්වනු ලබන්නේ,
    1. මූලධර්ම අතර ඒකීයභාවයක් නොමැති නිසාය.
    2. නිශ්චිත අනාවැකි ඵලකිරීමේ නොහැකියාව නිසාය.
    3. හේතුඵලවාදය මත පිහිටා කරුණු ඉදිරිපත් කිරීමට හැකියාව ඇති නිසාය.
    4. පර්යේෂණ පැවැත්වීම සඳහා විද්‍යාගාර ශිල්ප ක්‍රම භාවිතා කිරීමේ නොහැකියාව නිසාය.
    5. විෂය අධ්‍යයනයට ඒකීය විධික්‍රම නොමැතිවීම නිසාය.

05. රාජ්‍ය
1. නිශ්චිත දේශපාලන ව්‍යුහයකින් සමන්විත දේශපාලන සංවිධානයකි.
2. පොදු ආශාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වීම යන නාමය සහිත දේශපාලන ආයතන පද්ධතිය වේ.
3. ස්වාධිපති බලයේ උත්තරීතර හිමිකරුවා වේ.
4. ආණ්ඩුවේ දේශපාලන හස්ථය වේ.
5. එයටම ආවේනික නිලනාමයකින් යුක්ත වේ.

06. ජාතික රාජ්‍ය,
1. එක් ජාතියකට එක් රාජ්‍යයක් යන සංකල්පය මත පදනම් වේ.
2. මධ්‍යගත පාලනයකින් යුක්ත වේ.
3. භූමිය ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍ය යන අංගවලින් සමන්විත වේ.
4. සංස්කෘතික විවධත්වය හා දේශපාලන අසමගිකම ආරක්ෂා කරන රාජ්‍ය ක්‍රමය වේ.
5. අන්තර් ජාතික දේශපාලනයේ මූලික ඒකකය ලෙස පොදුවේ පිළිගනු ලබයි.

07. ස්වාධිපත්‍යය,
1. රාජ්‍යයේ නීතිවලට සුජාතභාවය සපයයි.
2. රාජ්‍යයන් පමණක් භුක්තිවිඳින උසස්ම බලය ලෙස ද හැඳින්වේ.
3. රාජ්‍යයේ වැදගත්කම හා විශේෂිතම අංගය වේ.
4. ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය හා පැවැත්ම සාධාරණීකරණය කෙරේ.
5. ප්‍රබල රාජ්‍ය වලින් දුබල රාජ්‍ය වෙන් කර හඳුනා ගැනීමට යොදා ගනී.

08. ආණ්ඩුව,
1. රාජ්‍යයේ ස්වාමියා වේ.
2. රාජ්‍යයේ මොළය වේ.
3. ඒකීය හා සන්ධීය පදනම මත සංවිධානය කරනු ලබයි.
4. රාජ්‍ය නැමැති නෞකාවේ සුක්කානම හසුරුවන්නා වෙයි.
5. රාජ්‍ය හා ජනතාව එකට යා කරන මාධ්‍යවෙයි.

09. ඒකීය ආණ්ඩු,
1. ගොඩ නැගී ඇත්තේ එක් බල මධ්‍යස්ථානයක් පදනම්කරගෙන ය.
2. මධ්‍යම ආණ්ඩුව මගින් පමණක් ජාතියේ ආශාවන් ප්‍රකාශ කරයි.
3. එක් පුරවැසිභාවයක්, නීති ක්‍රමයක්, අධිකරණ ක්‍රමයක් හා සිවිල් සේවයක් ඇත.
4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය අවධාරිත කළ පළාත් ආණ්ඩු දැකිය හැක.
5. ආණ්ඩුවේ වගකීම් පැහැදිලිව හඳුනා ගැනීමට උපකාරීවේ.

10. සන්ධීය ආණ්ඩු
1. බලය බෙදීමේ ආදර්ශයක් වේ.
2. පරිධියේ ආණ්ඩු මධ්‍යම ආණ්ඩුවට යටත් වේ.
3. විවිධත්වය තුළින් ඒකීයත්වය ගොඩනංවයි.
4. එකිනෙකට වෙනස් තල දෙකක ආණ්ඩු පවතී.
5. විවිධ වාර්ගික ජන කොටස් එක් දේශපාලන ක්‍රමයකට අනුගත කෙරේ.

11. කැබිනට් ආණ්ඩු,
1. පාර්ලිමේන්තු ආණ්ඩු ලෙස ද හඳුන්වයි.
2. විධායකය නාමික හා සත්‍ය ලෙස කොටස් දෙකකින් යුක්ත වෙයි.
3. කැබිනට් මණ්ඩලයේ ඒකාධිපතිත්වයක් දැකිය හැකි වෙයි.
4. හොඳින් සංවිධානය වූ ද්විපක්ෂ ක්‍රමයක් යටතේ සාර්ථකව ක්‍රියාත්මක වෙයි.
5. සාමූහික වගකීම් මූලධර්මය අනුගමනය කරයි.

12. ජනාධිපති ආණ්ඩුක්‍රමය,
1. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සමීප සබඳතාවයක් නිර්මාණ කරයි.
2. බලතල බෙදීමේ පදනම මත ක්‍රියාකරයි.
3. වඩාත් කාර්යක්ෂම නමුත් ප්‍රජාතන්ත්‍රියභාවයෙන් අඩු ආණ්ඩු ක්‍රමයක් ලෙස ද සැළකේ.
4. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයට විකල්පයක් වේ.
5. දේශපාලන පක්ෂවල බලපෑම අවම කරයි.

13. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක මූලික ලක්‍ෂණ වන්නේ,
   1. ක්‍රියාත්මක වීම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් මත සිදුවීම.
   2. ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන අතර බලතල බෙදීමක් දැකිය හැකි වීම.
   3. නායකත්වය ජනතාවට වගකීමට බැඳී සිටීම
   4. අයිතිවාසිකම් සීමාවන්ට යටත් කොට ක්‍රියාවට නැංවීම.
   5. නීතියේ සර්ව සාධාරණත්වය සැමවෙත ක්‍රියාත්මක කිරීම.

14. සමාජවාදී ආණ්ඩුවක මූලික ලක්‍ෂණ වන්නේ,
   1. ඒක පක්‍ෂ නායකත්වයක් ක්‍රියාත්මක වීම.
   2. ඒක බල පාලනයක ක්‍රියාකාරීත්වයක් දැකිය හැකි වීම.
   3. පාලකයන් තෝරා ගැනීමට සර්වජන ඡන්ද බලය උපයෝගී කර ගැනීම.
   4. කොමියුනිට්ස් සමාජ ක්‍රමයක් ගොඩනැංවීමේ අවසාන අපේක්‍ෂාව.
   5. ආර්ථික සමානාත්මතාවයක් ක්‍රියාත්මක වීම.

15. ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමයක මූලික ලක්‍ෂණ වන්නේ,
   1. පැහැදිලි දේශපාලන ආර්ථික හා සමාජ දර්ශනයක් ක්‍රියාත්මක වීම.
   2. අනුග්‍රාහක පත්කිරීම් මත ආණ්ඩුව පවත්වාගෙන යාම
   3. තමන් විසින්ම පත්කරගත් නායකයෙක් පාලනය ගෙන යාම.
   4. තරඟකාරී දේශපාලන පක්‍ෂ ක්‍රමයක් නොමැති වීම.
   5. පාලකයා වගකීමට යටත් නොවීම.

16. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක මූලික ලක්‍ෂණ වන්නේ,
   1. ව්‍යවස්ථානුකූලව ආණ්ඩුවක ක්‍රියාකාරීත්වයක් දැකිය හැකි වීම.
   2. මහජන ස්වාධිපතිත්වය හා ජනතාව පාලකයන්ට වගකීමට බැඳී සිටීමක් දැකිය හැකි වීම.
   3. තරඟකාරී පක්‍ෂ ක්‍රමයක ක්‍රියාකාරීත්වයක් දැකිය හැකි වීම.
   4. මාධ්‍ය නිදහස උපරිමයෙන් ආරක්‍ෂා කිරීම.
   5. අධිකරණය සියලු බලපෑම්වලින් මිදී ක්‍රියාත්මක වීම.

❖ **17 සිට 31 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

17. ව්‍යවස්ථාදායකය,
   A ඒකමාණ්ඩලික හෝ ද්විමාණ්ඩලික විය හැක.
   B ප්‍රජාතාන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස ද සැළකේ.
   C තෝරා පත්කරන සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත වේ.
   D ප්‍රතිපත්ති සම්පාදනයේ හිමිකම ඇති විධායක ආධිපත්‍යයට යටත්වුවක් ද වෙයි.
   E නීති සම්පාදනය, මූල්‍ය පාලනය, විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම ආදිය ක්‍රියාත්මක කරයි.
   1. ABCD   2. BCDE   3. ABDE   4. ACDE   5.ABCE

18. විධායකය
   A නීති විනිශ්චය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරයි.
   B දේශපාලන හා ස්ථිර යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වෙයි
   C ආණ්ඩු යාන්ත්‍රණය මෙහෙයවන ප්‍රධාන ධාවකයා වෙයි.
   D ඕනෑම දේශපාලන ක්‍රමයක දේශපාලන පිරමීඩයේ ඉහළම නිලය වෙයි.
   E රාජ්‍ය සැළසුම් ක්‍රියාවට නැංවීමේ ආණ්ඩු යාන්ත්‍රණය වෙයි.
   1. ABCD   2. BCDE   3. ABDE   4. ACDE   5.ABCE

19. අධිකරණය,
   A ස්වාධීන හා අපක්‍ෂපාතී ආයතනයක් වේ
   B රාජ්‍යයන්හි නීති ක්‍රියාවට නංවන්නා වේ.
   C ජනතා අයිතිවාසිකම් වල උත්තරීතර භාරකරුවා වේ.
   D යුක්තියේ හා සාධාරණත්වයේ ආරක්‍ෂකයා වේ.
   E දේශපාලන ක්‍රමයක පවතින උසාවි පද්ධතිය වේ.
   1. ABCD   2. BCDE   3. ABDE   4. ACDE   5.ABCE

20. නීතිය,

A මිනිසාගේ අභ්‍යන්තර හැසිරීම පාලනය කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

B සැමවිටම යම් පිළිවෙතකට අනුව ලේඛනගත වේ.

C සිවිල් සමාජයේ අනුමැතිය මත රජය විසින් බලාත්මක කරනු ලැබේ.

D සියලු දෙනාටම ඉහළින් ක්‍රියාත්මක කළ යුතුවේ.

E කඩකළවිට දඬුවමට යටත්වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

21. මානව අයිතිවාසිකම්

A විශ්වීය මූලික හා අසභාය වේ.

B දෙවියන් වහන්සේ විසින් මිනිසාගේ යහපත වෙනුවෙන් පිරිනමන ලද්දක් වේ.

C මිනිසුන් වීම නිසාම මිනිසුන්ට හිමිවන්නක් වේ.

D යහපත් ජීවිතයක් පවත්වාගෙන යාමට මිනිසාට උපකාරී වේ.

E අර්ථවත් වීමට නම් ගරු කිරීම අවශ්‍යම වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

22. සිවිල් සමාජය,

A ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට අත්‍යවශ්‍ය අංගයක් වේ.

B ජනතාව දේශපාලන හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමට උපකාරී වේ.

C රාජ්‍ය පාලනයෙන් මුලුමනින්ම වියුක්ත වේ.

D ආණ්ඩුවේ බලය පාලනය කිරීමට යෙදවිය හැක්කක් වේ.

E රාජ්‍ය හා පවුල යන සංවිධානවලට පරිබාහිරව ගොඩනගා ඇති මධ්‍යස්ථ සංවිධානවලින් සමන්විත වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE

23. දේශපාලන පක්ෂ,

A දේශපාලන ක්‍රීඩාවේ නියුක්ත වූවක් වේ.

B මැතිවරණ ජයග්‍රහණයෙන් දේශපාලන බලය ක්‍රියාවට නැංවීම ඉලක්ක කරගත් සංවිධානයක් වේ.

C නිල කාඩ්පතක් සහිත සාමාජිකත්වය දරන සාමාජිකයන්ගෙන් යුක්ත වේ.

D නූතන දේශපාලනයේ ජනතාව සංවිධානය කිරීමේ ප්‍රධාන මාධ්‍ය වේ.

E මහජන මතය ඒකරාශී කිරීමේ වගකීම දරන්නා වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4.ACDE 5.ABCE

24. බලපෑම් කණ්ඩායම්

A ආශා කණ්ඩායම් යනුවෙන් ද හඳුන්වයි.

B ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට හිතකර දෙයක් ලෙස පිළිගනී.

C පෞද්ගලික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා සංවිධානය කරනු ලබන ජනතා සංගම් වේ.

D ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථක ක්‍රියාකාරීත්වයට අත්‍යාවශ්‍ය වේ.

E දේශපාලන සමාජානුයෝජනයේ ඒජන්තවරයා ලෙසින් ද සැළකේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

25. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A ආණ්ඩුවේ නීතිමය රාමුව විදහා දක්වන ලියවිල්ල වේ.

B දේශපාලන ක්‍රීඩාව සිදුකිරීමේ ක්‍රම සහ විධිවලට සම්බන්ධ මූලික නීති නිරූපණය කරයි.

C රටක දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වයට අදාළ නීති පද්ධතිය අඩංගු ලියවිල්ල ලෙස ද හඳුන්වයි.

D ලිඛිත - අලිඛිත, නම්‍ය - අනම්‍ය, ඒකීය - සංඝීය ලෙස වර්ග කරයි.

E රටක පුරවැසියන්ගේ සමාජ හැසිරීම සම්බන්ධව නීති හා රෙගුලාසි දැක්වෙන ලියවිල්ල ලෙස ද හඳුන්වයි.

1. ABCD 2.BCDE 3. ABDE 4.ACDE 5.ABCE

26. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණවල දේශපාලන සමාජ හා ආර්ථික ප්‍රතිවිපාක සමහරක් වන්නේ,

A නිදහස් ශ්‍රම වෙළඳපලක් බිහිවීම.

B ස්වාධීන හා ඒකීය අධිකරණ ක්‍රමයක් ස්ථාපිත වීම.

C කුල වෙනස්කම් වැඩිවීම.

D ජනතා නියෝජනය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක වීම.

E ඒකීය පරිපාලන ක්‍රමයක් ඇතිවීම

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

27. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ,

A දේශිය ආර්ථිකය අන්තර්ජාතික වෙළඳපළට බද්ධ විය.

B ග්‍රාමීය කෘෂිකර්මාන්තය සීඝ්‍රයෙන් දියුණු විය

C ප්‍රාදේශීය පරිපාලන ක්‍රමය වර්ධනය විය.

D දේශීය මධ්‍යම පන්තියක් බිහිවිය.

E පළාත් 16 පළාත් 5 දක්වා අඩු විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

28. ලංකා ජාතික සංගමය

A පිහිටුවීම 1919 දී සිදුවිය.

B පුළුල් ජනතා ව්‍යාපාරයක් බවට පත් විය.

C ඉල්ලීම් දිනා ගැනීම සඳහා සාමකාමී ක්‍රියාමාර්ග අනුගමනය කළේය.

D කොමියුනිට්ස් විරෝධී ව්‍යාපාරයක් විය.

E ප්‍රභූ නායකත්වය සහිත ව්‍යාපාරයක් ලෙස සළකන ලදී.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

29. ලංකා වාමාංශික ව්‍යාපාරය

A 1930 ගණන්වල දී පැන නැගුණු ව්‍යාපාරයක් විය.

B ඉංග්‍රීසි උගත් රැඩිකල් තරුණ පිරිස් විසින් ආරම්භ කළ ව්‍යාපාරයක් විය.

C නිදහස දිනා ගැනීම හා සමාජවාදී සමාජක්‍රමයක් ස්ථාපිත කිරීම අරමුණු කොට ගත්තේය.

D ලංකා ජාතික සංගමය සමඟ ඉතාමත් සහයෝගයෙන් ක්‍රියාකල ව්‍යාපාරයක් විය.

E සංවිධානාත්මක ව්‍යාපාරයක් බවට 1935 දී පත් විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

30. ලංකා සමසමාජ පක්ෂය.

A පිහිටුවීම 1935 දී සිදුවිය.

B ලංකාවේ බිහිවූ ප්‍රථම දේශපාලන පක්ෂය විය.

C මාක්වාදය වැළඳගත් තරුණ රැඩිකල් කණ්ඩායමක් විසින් ආරම්භ කරන ලදී.

D ලංකාව තුළ සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවීම අරමුණු කර ගත්තේය.

E ආරම්භයේ දී සංවිධානය වූයේ කේඩර පක්ෂයක් ලෙසය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

❖ **අංක 31 සිට 45 දක්වා සපයා ඇති ප්‍රකාශවලින් හතරක් නිවැරදි වන අතර එකක් සාවද්‍ය වේ. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

31. 1911 - 1920 කාලය තුළ ක්‍රියාවට නැංවුණු ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හේතුවෙන් ලංකාවේ ආණ්ඩුකරණය හා සම්බන්ධ වැදගත් වෙනස්වීම් කිහිපයක් වන්නේ,

1. මුදල් කාරක සභාව පිහිටුවීම.
2. ආණ්ඩුකාරවරයා නාමමාත්‍ර මට්ටම පහත දැමීම.
3. ව්‍යවස්ථාදායකයේ නිලනොලත් සාමාජික සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි කිරීම.
4. සීමිත ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම.
5. වාර්ගික නියෝජනය තව දුරටත් පවත්වාගෙන යාම.

32. 1924 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය
1. ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් 49 දක්වා පුළුල් කරන ලදී.
2. ආණ්ඩුකාරවරයාගේ බලය පුළුල් ලෙස කප්පාදු කිරීමට පියවර ගන්නා ලදී.
3. නිල නොලත් මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව වැඩිකරන ලදී.
4. වගකිමෙන් බලය වෙන් කිරීමට ක්‍රියා කරන ලදී.
5. වාර්ගික නියෝජනය තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී.

33. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
1. විධායක කාරක සභා ක්‍රමයක් හඳුන්වාදෙන ලදී.
2. ඇතැම් කොන්දේසිවලට යටත්ව අවුරුදු 21 ට වැඩි සියලු දෙනාට ඡන්ද බලය ප්‍රධානය කරන ලදී.
3. ප්‍රාදේශීය නියෝජනය ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී.
4. නාමික ආණ්ඩුකාර ධූරයක් ස්ථාපිත කරන ලදී.
5. ව්‍යවස්ථාදායක හා විධායක කාර්යයන් ද්විත්වයම පැවරුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවක් ස්ථාපිත කරන ලදී.

34. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපීපෙනෙන ලක්ෂණයන් වන්නේ,
1. මන්ත්‍රීවරු 61 දෙනෙකුගෙන් සමන්විත ව්‍යවස්ථාදායකය.
2. දේශපාලන අර්බුදවලට මැදිහත්වීමෙන් ඈත් කළ ආණ්ඩුකාරධූරය.
3. රාජ්‍ය මන්ත්‍රණ සභාවට වග කියන ආණ්ඩුකාරධූරය.
4. ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් යටතේ සංවිධානය කරන ලද සිවිල් සේවාවක් දැකිය හැකි වීම.
5. කථානායකවරයාගේ නායකත්වය සහිත ව්‍යවස්ථාදායකය.

35. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ අමාත්‍ය මණ්ඩලය
1. සාමූහික වගකීමේ මූලධර්මය ක්‍රියාවට නැංවීය.
2. සාමාජිකයන් 10 දෙනෙකුගේ සමන්විත වීය.
3. වාර්ෂික අය වැය හා මුදල් කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට වග කියන ලදී.
4. 7/10ක බලයක් ලාංකිකයන්ට හිමිකර දුන්නේය.
5. ප්‍රධාන ලේකම්වරයාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක විය.

36. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය නිලධාරීන් තිදෙනා.
1. අධිරාජ්‍යවාදය ආරක්ෂා කළ මුර බල්ලන් ලෙස හඳුන්වන ලදී.
2. රාජ්‍යයේ ප්‍රධාන අමාත්‍යධූර තුනක් ක්‍රියාත්මක කරන ලදී.
3. රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමූහිකව වගකියන ලදී.
4. ආණ්ඩුකාරවරයා සමඟ එක්ව වෙනම විධායක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරන ලදී.
5. ලාංකික ඇමතිවරුන්ට උපදෙස් දෙන්නන් ලෙස ක්‍රියාකරනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

37. 1948 සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.
1. කැබිනට් මාදිලියේ ආණ්ඩුක්‍රමයක් ලංකාවට හඳුන්වා දෙන ලදී.
2. බ්‍රිතාන්‍ය තුළ ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රධානය කරන ලදී.
3. අධිකරණ ඇමති සෙනෙට් මණ්ඩලයෙන් තෝරාගත යුතු බව නියම කරන ලදී.
4. බ්‍රිතාන්‍ය කිරීටයට තවදුරටත් රාජ්‍ය නායක ධූරය ලබා දෙන ලදී.
5. අවසාන අභියාචනාධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පිරිනමන ලදී.

38. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,
1. නාමික හා සත්‍ය ලෙස විධායකයන් දෙකක් ස්ථාපනය කළේය.
2. සත්‍ය විධායකය ලෙස අගමැතිවරයා ක්‍රියා කළේය.
3. ද්විමාණ්ඩලික පාර්ලිමේන්තුවක ක්‍රියාකාරීත්වයක් ක්‍රියාත්මක කළේය.
4. දේශපාලන විධායකයට යටත් රාජ්‍ය සේවයක ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන යනු ලැබීය.
5. සුලුජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය.

39. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ක්‍රියාකාරී විධායකය
   1. අගමැති නමින් හැඳින්වුණු ඇමතිවරයෙකුගේ නායකත්වයෙන් ක්‍රියාත්මක විය.
   2. පාර්ලිමේන්තුවට සාමූහිකව වග කියන ලදී.
   3. ව්‍යවස්ථාදායකය සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මඟින් තනතුරෙන් ඉවත්කළ හැකිවිය.
   4. ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් අතරින් නාමික විධායකය විසින් පත්කරන ලදී.
   5. සත්‍ය විධායකය ලෙස ද හඳුන්වනු ලැබීය.

40. 1948 ව්‍යවස්ථාදායකය
   1. පාර්ලිමේන්තු ස්වධිපත්‍යය මූලධර්මය පදනම් කර ගෙන ස්ථාපිත කරනු ලැබීය.
   2. 29(2) වගන්තියට යටත්ව නීති පැනවීමේ බලය බුක්ති වින්දේය.
   3. පාර්ලිමේන්තුව යන නිල නාමයෙන් හඳුන්වනු ලැබීය.
   4. ඡන්දයෙන් හා නාමකරණයෙන් පත්කළ නියෝජිතයන්ගෙන් සමන්විත විය.
   5. දේශපාලන විධායකයට අවශ්‍ය බහුතරය සපයා දුන්නේය.

41. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව,
   1. කැබිනට් ආකෘතිය තවදුරටත් පවත්වාගෙන ගියේය.
   2. නාමික ජනාධිපති ධූරයක් ස්ථාපිත කිරීමට පියවර ගත්තේය.
   3. පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය මත පදනම් වූ ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කළේය.
   4. තවදුරටත් බ්‍රිතාන්‍ය රැජිණට යටත් වූ ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක කළේය.
   5. ශ්‍රී ලංකාව ස්වෛරී ස්වාධීන ජනරජයක් බවට පත් කළේය.

42. 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායකය.
   1. හැඳින්වූයේ ජාතික රාජ්‍ය සභාව වශයෙනි.
   2. ජනතා පරමාධිපත්‍ය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් නීතිමය සීමාවක් නොවීය.
   3. ඡන්දයෙන් හා නාමකරණයෙන් පත් වූ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විය.
   4. ජනතාවගේ ව්‍යවස්ථාදායක, විධායක අධිකරණ යන බලතල ක්‍රියාවට නැංවිය
   5. රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර උපකරණය ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ හැඳින්විණ.

43. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැකිය හැකි මූලික ලක්ෂණ වන්නේ,.
   1. සත්‍ය විධායකයේ නායකයා විසින් නාමික විධායකය තෝරා පත් කර ගැනීම.
   2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක ක්‍රියාකාරීත්වයක් දැකිය හැකි වීම.
   3. සහතික කිරීම සඳහා නීතිමය රාමුවක් රහිත මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ක්‍රියාත්මක වීම.
   4. බලතල බෙදා දැක්වූ ව්‍යවස්ථාදායකය.
   5. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැංවීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම මාලාව.

44. 1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේදී භාවිතයට ගත් දේශපාලන න්‍යායයන් වන්නේ,
   1. පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය න්‍යාය.
   2. බලතල බෙදීමේ න්‍යාය.
   3. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය
   4. සාමූහික වගකීමේ න්‍යාය
   5. මහජන ස්වාධිපති න්‍යාය

45. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
   1. විධායක ජනාධිපතිධූරයක් ස්ථාපිත කළේය.
   2. ඒක මණ්ඩලික පාර්ලිමේන්තුවක් ක්‍රියාත්මක කළේය.
   3. පළාත් සභා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය.
   4. අධිකරණ විවරණ බලය සහිත ශ්‍රේෂ්ඨාධිකරණයක් ඇති කළේය.
   5. ජනාධිපතිවරයෙකු හා කැබිනට් මණ්ඩලයකින් යුතු දෙමුහුන් විධායකයක් ස්ථාපිත කළේය.

❖ **අංක 46 - 50 දදක්වා ප්‍රශ්නයේ මාතෘකාවට අනුකූලව ඉදිරිපත් කර ඇති කරුණු වලින් හතරක් සාවද්‍ය වේ සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

46. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

A ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කිරීමට බෙහෙවින් දායක විය..

B නීති සම්පාදනය පිළිබඳ පූර්ණ ස්වාධිපත්‍ය බලය ව්‍යවස්ථාදායකයට ලබා දුන්නේය.

C ජනරජයේ මූලික ව්‍යවස්ථානුකූල පදනම බවට ගෝලිස්ට් ජනාධිපති ක්‍රමය පත් කළේය.

D ඇමරිකන් ජනාධිපතිවරයාට සමාන විධායකයක් ලංකාව තුළ ක්‍රියාත්මක කළේය.

E පාර්ලිමේන්තුවට යටත් කළ සිවිල් සේවාවක ක්‍රියාකාරීත්වයක් ස්ථාපිත කළේය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

47. 1978 ව්‍යවස්ථාව යටතේ නිර්මාණය කළ ජනාධිපති තනතුරෙහි ආරම්භක ස්වරූපය,

A වසර හයක් සඳහා ජනතාව විසින් සෘජුවම තෝරා පත් කර ගැනීම.

B රාජ්‍යයේ නායකයා වශයෙන් ජනපති ද ආණ්ඩුවේ නායකයා වශයෙන් අගමැති ද ක්‍රියා කිරීම.

C පාර්ලිමේන්තුවට වග කියන ජනාධිපතිධූරයක් ඇති කිරීම.

D පාර්ලිමේන්තුවේ දී සම්මත කරන දෝෂාභියෝගයක් මගින් තනතුරෙන් ඉවත් කළ හැකි වීම.

E කාර්යක්ෂමතාවයෙන් අඩු ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක වීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

48. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කළ 19 වන සංශෝධනයෙහි දැකිය හැකි වෙනස්කමක් වන්නේ,

A පාර්ලිමේන්තුවේ නිලකාලය වසර හයක් බවට පත් කිරීම.

B ඕනෑම වාර ගණනක් ජනාධිපතිට එම ධූරයෙහි ක්‍රියා කිරීමට අවස්ථාව උදාකර දීම.

C පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි පූර්ව අධිකරණ නිරීක්ෂණ බලය ඉවත් කිරීම

D පාර්ලිමේන්තුව විසුරුවා හැරීම වසර හතරකට දීර්ඝ කිරීම.

E ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

49. ශ්‍රී ලංකාවේ පළාත් සභා

A දිස්ත්‍රික්කයට එකක් වන පරිදි පිහිටුවා ඇත.

B ප්‍රඥප්ති සෑදීමේ බලය භුක්ති වින්දේය.

C ජනාධිපතිගේ අනුමැතිය මත ප්‍රධාන ඇමති පත්කිරීමට යටත් විය.

D අමාත්‍යවරුන් දස දෙනෙකුගෙන් සමන්විත විය.

E 1987 අංක 10 දරණ පනත අනුව පිහිටුවා ඇත.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

50. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන

A අඩක් ඡන්දයෙන් ද අඩක් නාමකරණයෙන් ද තෝරා පත්කරන ලදී.

B ස්වාධීන හා සර්වාධිපති ආයතනයක් ලෙස ක්‍රියාත්මක විය.

C පළාත් සභාවල අධීක්ෂණයට යටත් විය.

D වසර හයක නිල කාලයකට තේරී පත්විය.

E ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය පවරනු නොලැබූ ආයතනයක් විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 23 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................. දේශපාලන විද්‍යාව II කාලය පැය තුනයි

- **1 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. සම්පූර්ණ පිළිතුරකට ලකුණු 1ක් ද, අර්ධ පිළිතුරකට ලකුණු 1/2 ක් ද හිමි වේ.**
- **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. එක් ප්‍රධාන ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමිවේ.**

## A කොටස

01. දේශපාලන බල අරගලය ක්‍රම දෙකකට සිදු කරනු ලබයි. එම ක්‍රම දෙක ලියන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

02. ග්‍රීක පෞර රාජ්‍යවල ඍජු ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථකව ක්‍රියාවට නැංවීමට බලපෑ හේතු 02ක් ලියන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

03. i සමූහාණ්ඩුව ii දේශපාලන ව්‍යාකරණ මෙම කෘතීන් දෙකේ කතුවරුන් පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

04. රාජ්‍යයක ස්වාධිපත්‍යය පැති දෙකකින් යුක්තය එම පැති දෙක නම් කරන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

05. පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් පෙන්නුම් කරන දේශපාලන සංවිධාන දෙක පිළිවෙලින් නම් කරන්න.

1. මෙම දේශපාලන සංවිධානය සමන්විත වන්නේ දේශ සීමාව තුළ වාසය කරන සියලුම පුරවැසියන්ගෙනි.
2. මෙම දේශපාලන සංවිධානය සමන්විත වන්නේ දේශසීමාව තුළ සිටින සාමාජිකයන් කොටසකගෙනි.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

06. රාජ්‍යයේ සම්භවය හා සම්බන්ධ ප්‍රධාන වාද දෙකක් පහත දැක්වේ. ඒවා හඳුනාගෙන නම් කරන්න.

1. රාජ්‍ය යනු සෙමින් හා අඛණ්ඩ සිදුවූ ඓතිහාසික වර්ධනයක ප්‍රතිඵලයකි.
2. රාජ්‍ය යනු ප්‍රකෘති සමාජයක ජීවත් වූ මිනිසුන් විසින් එළැඹෙන ලද සම්මුතියක ප්‍රතිඵලයකි.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

07. පහත දැක්වෙන ප්‍රකාශ දෙකෙන් අවධාරණය කරන දේශපාලන දාර්ශනිකයින් දෙදෙනා පිළිවෙලින් නම් කරන්න.

(i) දේශපාලන හා සමාජ චින්තන ඉතිහාසයේ ප්‍රථම විඥාණවාදී දාර්ශනිකයා

..........................................................................................................................................

(ii) දේශපාලන හා සමාජ චින්තන ඉතිහාසයේ ප්‍රථම යථාර්ථවාදී දේශපාලන දාර්ශනිකයා.

..........................................................................................................................................

08. (i) මෙම ආණ්ඩුක්‍රමය තුළ විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවතින සම්බන්ධතාවට දුරස්ථ වේ.

(ii) මෙම ආණඩු ක්‍රමය තුළ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පවතින සම්බන්ධතාවය සමීපවේ.

ඉහත දක්වා ඇති විධායක ව්‍යවස්ථාදායක සම්බන්ධතා දැකිය හැකි ආණ්ඩුක්‍රම දෙක පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

.

09. (i) මෙය පනත් කෙටුම්පත් සාකච්ඡා කිරීම සම්මත කිරීම සම්බන්ධ මූලික වගකීම හිමි අංශයයි.

(ii) මෙය රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක කිරීම හා රාජ්‍යයේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා සම්බන්ධ මූලික වගකීම හිමි අංශයයි.

ඉහත අංශ දෙක පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

10. (i) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේ දේශපාලන විධායකය නම් කරන්න.

..............................................................................................................................

(ii) බ්‍රිතාන්‍ය අධිකරණ ව්‍යුහය තුළ ඉහළම දේශපාලන අධිකරණය නම් කරන්න.

..............................................................................................................................

11. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේ වාර්ගික නියෝජනය හඳුන්වා දුන් හා එම නියෝජන ක්‍රමය අහෝසි කළ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ දෙක පිළිවෙලින් ලියන්න.

(i) ..............................................................................................................................

(ii) ..............................................................................................................................

12. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ සීමිත ඡන්ද බලය හඳුනවා දුන් හා සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ දෙක පිළිවෙලින් ලියන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

13. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය හැඳින්වූ නිල නාමය හා 1948 සෝල්බරි ව්‍යවස්ථාදායකය හැඳින්වූ නිල නාමය පිළිවෙලින් ලියන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

14. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද්විත්ව විධායකය නම් කරන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

15. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සුළුජාතීන්ගේ ආයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම සඳහා යෙදූ විධි විධාන දෙකක් ලියන්න.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

16. (i) 1972 ව්‍යවස්ථාවට අනුව පිහිටවූ නාමික වාධායකයේ නිල නාමය කුමක්ද?

..............................................................................................................................

(ii) 1972 ව්‍යවස්ථාවට අනුව පිහිටවූ නාමික විධායකයේ නිල කාලය කොපමණද?

..............................................................................................................................

17. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 19 සංශෝධනය යටතේ,

(i) ජනාධිපතිගේ නිල කාලය
(ii) එක් පුද්ගලයෙකුට එම නිලය දැරිය හැකි වාර ගණන සම්බන්ධයෙන් ඇති කළ වෙනස්කම් මොනවාද?

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

18. (i) ජනාධිපති මැතිවරණ පෙත්සම් විභාග කිරීම.

(ii) පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීම.

ඉහත දක්වා ඇති පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය සහිතව 1978 ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති අධිකරණ දෙක පිළිවෙලින් ලියන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

19. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන වර්ග දෙකක් ලියන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

20. ජනතා පරමාධිපත්‍ය ක්‍රියාවට නැංවීම සඳහා දෙවන ජනරජ ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති මධ්‍යයන් දෙකක් ලියන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................

# දේශපාලන විද්‍යාව

## 13 ශ්‍රේණිය - II කොටස

* **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.**

## B කොටස

01. දේශපාලන විද්‍යාවේ සමාජ විද්‍යාත්මක ස්වභාවය පිළිබඳ විග්‍රයක යෙදෙන්න. ( 20)

02. පහත ඒවායින් ඕනෑම දෙකක් විභාග කරන්න.
    1. සමාජ විකාශනයක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය
    2. සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය
    3. පංති අරගලයක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය (10 x 2 = 20)

03. පහත මාතෘකා දෙකක් සාකච්ඡා කරන්න.
    1. ඒකීය හා සංධීය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා
    2. නම්‍ය හා අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
    3. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ වාසි අවාසි (10 x 2 = 20)

04. පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.
    1. ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය තුළ විධායකයේ ක්‍රියාකාරීත්වය
    2. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ නාමික විධායකය
    3. ඉන්දියාවේ දේශපාලන විධායකයේ ක්‍රියාකාරීත්වය (10 x 2 = 20)

## C කොටස

05. කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රතිඵල විග්‍රහ කරන්න. (20)

06. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ආශ්‍රිතව පහත මාතෘකා විමසන්න.
    1. විධායක කාරක සභා ක්‍රමය
    2. සර්වජන ඡන්ද බලය (10 x 2 = 20)

07. 1948 සෝල්බරි ව්‍යවස්ථාව හා 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය පිළිබඳ සාකච්ඡා කරන්න. (20)

08. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පහත දැක්වෙන මාතෘකා සාකච්ඡා කරන්න.
    1. ජනාධිපති තෝරා පත්කර ගැනීමේ ක්‍රමය
    2. ජනාධිපතිවරයා තනතුරෙන් ඉවත් කිරීමේ ක්‍රමවේදය (10 x 2 = 20)

## දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018 - දේශපාලන විද්‍යාව

**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 3 | **11.** - 3 | **21.** - 4 | **31.** - 2 | **41.** - 4 |
| **02.** - 3 | **12.** - 1 | **22.** - 3 | **32.** - 2 | **42.** - 3 |
| **03.** - 3 | **13.** - 4 | **23.** - 4 | **33.** - 4 | **43.** - 4 |
| **04.** - 3 | **14.** - 3 | **24.** - 3 | **34.** - 3 | **44.** - 2 |
| **05.** - 4 | **15.** - 1 | **25.** - 1 | **35.** - 1 | **45.** - 4 |
| **06.** - 4 | **16.** - 2 | **26.** - 3 | **36.** - 3 | **46.** - 3 |
| **07.** - 5 | **17.** - 3 | **27.** - 4 | **37.** - 5 | **47.** - 2 |
| **08.** - 1 | **18.** - 2 | **28.** - 4 | **38.** - 4 | **48.** - 1 |
| **09.** - 4 | **19.** - 4 | **29.** - 5 | **39.** - 4 | **49.** - 4 |
| **10.** - 2 | **20.** - 2 | **30.** - 1 | **40.** - 1 | **50.** - 3 |

## දේශපාලන විද්‍යාව II පිළිතුරු
## A කොටස

01. (i) ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ග (i) ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රියා මාර්ග (විප්ලවකාරී)

02. (i) රාජ්‍යයේ භූමි ප්‍රමාණය කුඩාවීම (ii) දේශපාලන බලය පුරවැසියන්ට පමණක් හිමවීම.

03. ප්ලේටෝ , හැරල්ඩ් ජේ. ලැස්කි

04. (i) අභ්‍යන්තර ස්වාධිපත්‍යය (ii) බාහිර ස්වාධිපත්‍යය

05. (i) රාජ්‍ය (ii) ආණ්ඩුව

06. (i) විකාශනාත්මකවාදය (ii) සමාජ සම්මුතිවාදය

07. ප්ලේටෝ, ඇරිස්ටෝටල්

08. (i) ජනාධිපති ආණ්ඩුක්‍රමය (ii) කැබිනට් ආණ්ඩු ක්‍රමය

09. (i) ව්‍යවස්ථාදායකය (ii) විධායකය

10. (i) අගමැති (ii) ශ්‍රේෂ්ඨාධිකරණය

11. (i) 1833 කෝල්බෲක් කැමරන් ආන්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (ii) 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

12. (i) 1910 කෲව් - මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය (ii) 1931 - ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

13. (i) රාජ්‍ය මන්ත්‍රණ සභාව (ii) පාර්ලිමේන්තුව

14. (i) අග්‍රාණ්ඩුකාරවරයා (ii) අගමැතිවරයා

15. (i) 29 (2) වගන්තිය බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය, මහජන මන්ත්‍රී මණ්ඩලය 6ක් පත් කිරීම, සෙනෙට් මණ්ඩලයට 15ක් පත් කිරීම ආදී....

16. (i) ජනාධිපති (ii) වසර 4

17. (i) වසර 5 (ii) ඕනෑම වාර ගනනක සිට වාර 2 දක්වා අඩු කිරීම.

18. (i) ශ්‍රේෂ්ඨාධිකරණය (ii) අභියාචනාධිකරණය

19. (i) මහනගරසභා, නගර සභා, ප්‍රදේශ සභා

20. (i) පාර්ලිමේන්තුව, ජනමත විචාරණයක දී මහජනතාව (1 බැගින් 20 - 20 )

## B කොටස

01. 1. ලෝකයේ පවතින දැනුම් සම්භාරය ස්වභාවික විද්‍යා හා සමාජ විද්‍යා ලෙස බෙදිය හැකි බවත් විෂය අන්තර්ගතය, විෂය අධ්‍යයන විධික්‍රම, අන්තර් විෂයාත්මක සබඳතා දෙස බැලීමේ දී එය සමාජ විද්‍යා විෂයක් වන බව අවධාරණය කළ යුතුය. (ලකුණු 20 )

02. 1. රාජ්‍ය යනු සමාජ විකාශනයක ප්‍රතිඵලයක් බව පවසන විකාශනාත්මක වාදය පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් මින් අපේක්ෂා කෙරේ.
2. රාජ්‍යයේ ආරම්භය හා වර්ධනය පිළිබඳ, සමාජ සම්මුතිවාදීන් ඉදිරිපත් කර ඇති අදහස් ඒවායේ වැදගත්කම හා අදාලත්වය විග්‍රහකිරීමක් අපේක්ෂා කෙරේ.
3. එක් පන්තියක් විසින් තවත් පන්තියක් පාලනයට හසුකර ගන්නා ආකාරය ප්‍රාග් කොමියුනිට්ස් යුගයේ සිට නවීන කොමියුනිස්ට් යුගය දක්වා සිදුවූ ආකාරය විමසා බැලීමක් මෙයින් අපේක්ෂා කෙරේ. (ලකුණු 20 )

03. 1. බලතල බෙදීමේ ආකාරය හා ස්වභාවය අනුව වර්ග කරණ මෙම වර්ගීකරණය පිළිබඳ, විධිමත් විවේචනාත්මක විග්‍රහයක් අපේක්ෂා කෙරේ.
2. වෙනස් කිරීමට සාමාන්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරන නම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා වෙනස් කිරීමට විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කරන අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතර ඇති වෙනස්කම් පිළිබඳව විග්‍රහයක යෙදීම.
3. ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්‍ෂණ හා එහි වාසි අවාසි පිළිබඳ විග්‍රහ කිරීම. (ලකුණු 20 )

04. 1. ඇමෙරිකානු විධායකය තෝරා පත්කරගන්නා ක්‍රමවේදයත් එහි ක්‍රියාකාරීත්වය බලතල හා කාර්යයන් පිළිබඳ විග්‍රහ කිරීම.
2. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ රැජිණගේ ක්‍රියාකාරීත්වය හා ඇයට හිමි බලතල හා කාර්යයන් විමසීමට ලක්කිරීම.
3. ඉන්දියාවේ දේශපාලන විධායකය වන අගමැතිගේ බලතල හා කාර්යයන් එහි ක්‍රියාකාරීත්වය ආදී සාධක විමසීමට ලක් කිරීම. (ලකුණු 20 )

## C කොටස

05. 1. කෝල්බෲක් කැමරන් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය මිනිසාගේ සමාජ, ආර්ථික දේශපාලනයට කළ බලපෑම් පිළිබඳ විග්‍රහ කිරීම. (ලකුණු 20 )

06. 1. විධායක කාරක සභා ඇති වීම පිළිබඳවත් එම විධායක කරක සභා වල ක්‍රියාකාරීත්වය පිළිබඳවත් විග්‍රහ කිරීම.
2. සර්වජන ඡන්දබලය හඳුන්වා එය ප්‍රධානය කිරීම තුළින් ලංකාව තුළ ඇති වූ සමාජීය ආර්ථික හා දේශපාලන වෙනස් වීම් පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීම. (ලකුණු 20 )

07. 1947 හා 1972 පිහිට වූ ව්‍යවස්ථාදායකයන් වෙන වෙනම ගෙන ඒවාට නිති සම්පාදනය සම්බන්ධයෙන් හිමිව තිබූ බලතල පිළිබඳ සාකච්ඡා කිරීම. (ලකුණු 20 )

08. 1. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන විධි විධාන අනුව ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් සහ ජයග්‍රාහී අපේක්ෂකයා තෝරා පත්කරගන්නා තෙක් අදාළ ක්‍රියාවලිය පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීම.
2. ජනාධිපතිවරයා තනතුරෙන් ඉවත් කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දී ඇති දෝෂාභියෝග විධි විධාන හා ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට සහ අධිකරණයට ලබා දී ඇති වගකීම් හා යුතුකම් පිළිබඳව විග්‍රහ කිරීම.

(ලකුණු 20 )